ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**
**Business & Accounting Studies**

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2015 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2015 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2015

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලු සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. ප්‍රසාද් කොළඹ තදාසන්න ප්‍රදේශයක් වන රාජගිරිය නගරයේ ඉපදී එහි හැදී වැඩුණු තරුණයෙකි. පාසල් අධ්‍යාපනය එතරම් සාර්ථක කර ගැනීමට නොහැකි වූ ඔහු සා.පෙළ දක්වා ඉගෙනුම ලැබීය. නමුත් උසස් පෙළ කිරීම සඳහා සමත් සාමාර්ථයක් ලබා ගැනීමට ඔහු අපොහොසත් විය.

නමුත් ප්‍රසාද් පාසලේ දී හැදෑරූ ලෝහ වැඩ විෂයේ දී ඉතා දක්ෂයෙක් විය. නිර්මාණශීලි අදහස් ඇති, ක්‍රියාශීලි දරුවෙක් බව එම විෂය හැදෑරීමේ දි ගුරුවරුන්ට පෙනී ගියේ ය. ඉතා සියුම් නිර්මාණ සඳහා හොඳ හැකියාවකුත් ඒ සඳහා ඉවසිමකුත් ඔහු සතු විය. පාසලේ නොයෙකුත් උත්සවවල දි තොරන් සෑදීම, සම්මාන ඵලක සෑදිම වැනි කාර්යයන් සඳහා ප්‍රසාද් නැවතුම බැරි ශිෂ්‍යයෙකු විය.

ප්‍රසාද් සා.පෙළ විභාගයෙන් පසු අවුරුදු කීපයක් ම ගෙදර රැඳී සිටි අතර එම අලසකම දරාගත නොහැකි හෙයින් ඔහුගේ මාමා කෙනෙකු සතුව මහරගම ප්‍රදේශයේ තිබූ පාවාහන් නිෂ්පාදන ආයතනයක වැඩකිරීම සඳහා පිටත් විය. ඔහුගේ මාමා ප්‍රසාද් කෙරෙහි පැහැදී ඔහුට මාමා දන්නා බොහෝ ශිල්ප ක්‍රම ඉගැන්විය. ප්‍රසාද් ඉහත සඳහන් හැකියාවන් නිසා ඉක්මනින් පාවාහන් නිපදවීමේ ඉතා දක්ෂයෙකු විය.

ඉන්පසුව වසර කිහිපයකට පසු මාමාගේ ද ආශිර්වාදය ඇතිව ප්‍රසාද් බොරැල්ල ප්‍රදේශයේ පවාහන් නිපදවීමේ කුඩා කර්මාන්ත ශාලාවක් "ප්‍රසාද් ෂූ පැලස්" නමින් ඇරඹිය.

ප්‍රසාද් ව්‍යාපාරයේ ආරම්භ කිරිමේ දී මාමා ඉතිරිකර ගත් රු. 90,000 ක් ද, ප්‍රසාද් සතුව පැවති ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය වූ රු. 25,000 මුදලක් ද යොදවා 2015.01.01 දින ව්‍යාපාරය ආරම්භ කරන ලදි. එමෙන්ම බැංකුවකින් රු. 40,000ක ණය මුදලක් ගැනීමට ප්‍රසාද්ට හැකි විය. එම මුදලද ව්‍යාපාරයට යෙදවිය. රු. 50,000ක් වැය කර පාවාහන් මැසිමට යන්ත්‍රයක් මිලට ගෙන ඇත. පාවාහන් නිෂ්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කිරිමට ජනවාරි මාසයේ හම් හා නූල් මිලට ගැනිමට රු. 40,000 ක් ද රබර් සඳහා රු. 7,000 වැය කර ඇත. එම මාසයේ පාවාහන් අලෙවියෙන් රු. 61,000 ක් උපයා ඇත. ප්‍රසාද් තම මුදල් කටයුතු පහසුකර ගැනිමට මහජන බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කර ඇත. එමෙන්ම ජනවාරි මාසයේ 22 දින ප්‍රසාද් තමන්ට මෙම ව්‍යාපාරයට ආරම්භ කිරිමට උපකාරි වූ මාමාට රු. 12,000 ත්‍යාගයක් ලබා දෙන ලදි.

01. මෙම ව්‍යාපාරය අයත් වන්නේ කිනම් ව්‍යාපාර සංවිධාන වර්ගයට ද?
02. මෙම ව්‍යාපාරය දියුණු කිරීමට ඔබට කළ හැකි යෝජනා 2ක් සඳහන් කරන්න.
03. ඔහුගේ ව්‍යාපාරයේ එදිනෙදා ගනුදෙනු සටහන් කිරීමට යොදා ගත හැකි මූලික පොත කුමක් ද? එයට අදාල මූලාශ්‍ර ලේඛණ ලියන්න.
04. මෙම ව්‍යාපාරය ඇරඹීමට මොහුට තිබෙන ශක්තීන් 2ක් ලියන්න.
05. "ප්‍රසාද් ෂූ පැලස්" ආයතනය ලියාපදිංචි කළ යුතු ද ? ඒ ඇයි ?
06. මෙම "ප්‍රසාද් ෂූ පැලස්" ආයතනයේ ජනවාරි මාසයේ ලාභය කීයද ?
07. මෙම ව්‍යාපාරයේ ජංගම හා ජංගම නොවන වත්කම් වලට උදාහරණය බැගින් ලියන්න.
08. 2015.01.01 දිනට ව්‍යාපාරයේ වත්කම්, වගකිම් හා හිමිකම් කොපමණද ?
09. ප්‍රසාද් තම නිෂ්පාදන කටයුතු ප්‍රසාරණය කර ගැනිම සඳහා රු. 120,000ක් වටිනා පාවාහන් නිෂ්පාදනය කරන යන්ත්‍රයක් ණයට ලබා ගැනීමට සැලසුම් කලේ නම් එයට අදාල ද්විත්ව සටහන් ලියන්න.
10. ප්‍රසාද් විසින් මාමාට ලබා දුන් ත්‍යාගය ව්‍යාපාරයේ පොත්වල සටහන් වන්නේ ද? එසේ නොවේ ද? හේතුව සඳහන් කරන්න.

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

02. i. ව්‍යාපාරයක දැකිය හැකි පොදු අරමුණු 2ක් නම් කරන්න.
ii. නිෂ්පාදන සාධක නම් කරන්න.
iii. පාරිභෝගික වුවමනාවල ලක්ෂණ 4ක් නම් කරන්න.
iv. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් දැකිය හැකි ශක්තීන් 2ක් නම් කරන්න.
v. ආර්ථික පරිසරය කෙරෙහි බලපාන ආර්ථික පරිසර සාධක 4ක් නම් කරන්න. (ලකුණු 10 යි)

03. i. ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය අනුව වර්ග කෙරෙන ගැලීම් සටහන පෙන්වන්න.
ii. තනි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම් හා සමුපකාර යන ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කළ යුතු පණත් මොනවාද ?
iii. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 2ක් නම් කරන්න.
iv. රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තුවල වාසිය බැගින් සඳහන් කර මෙම ආයතන දෙකටම පොදු අවාසිය නම් කරන්න.
v. 1. ව්‍යාපාර කළමණාකරණ කටයුතු පුද්ගලයින් කිහිප දෙනෙකු මගින් සිදුකර ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා උචිතම ව්‍යාපාර සංවිධානය කුමක්ද ?
2. හවුල් ව්‍යාපාර ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වාගෙන යා යුතු බව ප්‍රකාශ කර ඇත්තේ කිනම් අවස්ථාවක දී ද? (ලකුණු 10 යි)

## II කොටස - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

04. 1. පහත දැක්වෙන ගනුදෙනු,
**වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්** සමීකරණයට ඇතුලත් කර පෙන්වන්න.
i. අයිතිකරු ප්‍රාග්ධන යෙදුවා රු. 100,000 යි.
ii. ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 20,000 යි.
iii. යන්ත්‍රයක් ව්‍යාපාරයට ගත්තා රු. 40,000 යි.
iv. බැංකු ණයක් ගත්තා රු. 50,000 යි.
v. ගමන් වියදම් දැරුවා රු. 2,000 යි. (ලකුණු 05 යි)

2. පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.
i. ණයගැතියෙකුට රු.1,200ක වට්ටමක් දුන්නා.
ii. රු. 15,000 භාණ්ඩ ණයට විකිණීම.
iii. ණයහිමියන්ට මුදල් ගෙව්වා රු. 10,000 යි.
iv. පෞද්ගලික ප්‍රයෝජනයට රු. 4,500 ව්‍යාපාරයෙන් ගත්තා.
v. විදුලි බිල ගෙව්වා රු. 4,100 යි. (ලකුණු 05 යි)

05. I. මුදල් පොතේ ඉටුකරන ද්විත්ව කාර්යය නම් කරන්න.

II. "සුළු මුදල්" අග්‍රිමය යනු කුමක්ද ?

III. ඉසුරිගේ ව්‍යාපාරයේ 2015 ජනවාරි මාසයට අදාල සුළු වියදම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2015 ජනවාරි | 01 | අග්‍රිමය ලැබුණා | රු. 2,000 |
| | 05 | ලොරි කුලි ගෙව්වා | රු. 200 |
| | 07 | මුද්දර ගත්තා | රු. 50 |
| | 09 | සංග්‍රහ ගාස්තු ගෙව්වා | රු 80 |
| | 12 | යතුරු ලියන කඩදාසි ගත්තා | රු. 40 |
| | 13 | ලියුම්කවර මිටියක් ගත්තා | රු. 120 |
| | 18 | වැටුප් අත්තිකාරම් ගෙව්වා | රු. 500 |
| | 22 | ටැක්සි කුලි ගෙව්වා | රු. 150 |
| | 26 | චමෝද් ට ගෙව්වා | රු. 300 |
| | 29 | අභ්‍යාස පොතක් ගත්තා | රු. 40 |
| | 30 | පරිත්‍යාගයක් කලා | රු. 140 |

ඉහත සදහන් තොරතුරු ගමන්, තැපල්, ලිපිද්‍රව්‍ය, විවිධ යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක ඇතුලත් කර අග්‍රිමය ප්‍රතිපූරණය කර දක්වන්න.

(ලකුණු 10 යි

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.